නොරොච්චෝලේ ලක්විජය ගල් අඟුරු බලාගාරය සඳහා **2022-2025** කාලපරිච්ඡේදයට අදාළව ගල් අඟුරු මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇගයීම සම්බන්ධයෙන් වූ විශේෂ විගණන වාර්තාව සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර කාරක සභාව මඟින් විමර්ශනය කරන ලද විශේෂ විගණන වාර්තාව සහ විමර්ශනයට ලක් කරන ලද කරුණු

	පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ	සී/ස ලංකා කෝල්(පුද්) සමාගමේ නිරීක්ෂණ	මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ නිරීක්ෂණ
01	ගල් අඟුරු ප්‍රසම්පාදන ක්‍රියාවලියට සම්බන්ධ සියළු පාර්ශව රජයේ අනුමත ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව සිය වගකීම් නිවැරදිව ඉටු කරනු ලබන බවට තහවුරු කිරීම හා එම තත්ත්වයෙන් බැහැර වන පාර්ශවයන්ට එරෙහිව සුදුසු පියවර ගැනීමේ අවශ්‍යතාවය අවධාරණය කෙරේ.	ප්‍රසම්පාදන කටයුතු නියමිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව සිය වගකීම් නිවැරදිව ඉටු කරන ලෙස අදාල පාර්ශවයන් වෙත උපදෙස් ලබා දී ඇත. ඇතිවන සුවිශේෂී තත්ත්වයන් මත ඉන් බැහැර වීමට සිදු වන්නේ නම් පමණක් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගනු ඇත. ඒ පිළිබඳව අදාල පාර්ශවයන් සමග සාකච්ඡා වට කිහිපයක්ම පැවැත්වීමෙන් පසුව අදාල තත්වයන් හඳුනාගෙන ඉදිරියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව සිය වගකීම් වඩාත් නිවැරදිව ඉටුකිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.	විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් සී/ස ලංකා කෝල්(පුද්) සමාගම සහ අදාළ අනෙකුත් පාර්ශව වෙත උපදෙස් ලබා දී ඇති බව නිරීක්ෂණය කරමි.
02	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ **1.2** ඡේදයේ සඳහන් අරමුණු වලට අගතියක් නොවන පරිදි සහ සැපයුම්කරුවන්ගේ මූල්‍ය ශක්‍යතාවය, පලපුරුද්ද, සැපයුමේ ගුණාත්මකභාවය, ප්‍රමාණවත් නෛතික බැඳීම් ඇතුළු මූලික අවශ්‍යතාවයන් ආරක්ෂා වන පරිදි ලංසුකරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පිලිගත හැකි මට්ටමකට ලිහිල් කර තරඟකාරීත්වය උපරිම කර ගැනීම පිළිබඳව අවධානය යොමු කල යුතුය.	මේ සම්බන්ධව අවශ්‍ය කටයුතු දැනටමත් සිදුකර ඇත. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ **1.2** ඡේදයේ සඳහන් අරමුණු වලට අගතියක් නොවන පරිදි සහ සැපයුම්කරුවන්ගේ මූලික අවශ්‍යතා ආරක්ෂා වන පරිදි සංශෝධනයක් ගෙන එමින් සැපයුම්කරුවන් ලියාපදිංචියට අදාලව පැවති **GCV** අගය **5900** සීමාව ඉවත් කිරීමට කටයුතු කර ඇත. මෙමඟින් වසර **03**ක අත්දැකීම් ඇති ඕනෑම ගල්අඟුරු සැපයුම්කරුවකුට සහභාගීවීමට ඉඩ සලසා දීමෙන් තරඟකාරීත්වය වැඩි කර ඇති අතර ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පිළිගත හැකි මට්ටමකට ලිහිල් කර ඇති අතර ලංකාවට පමණක් නොව වෙනත් රටකට ගල් අඟුරු සපයා පළ පුරුද්දක් ඇත්නම් එම තත්වයන්ද සැලකිල්ලට ගෙන ඇත.	විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් ලබා දී ඇති උපදෙස් පරිදි ලංසුකරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ අනිවාර්යයෙන් සිදු කල යුතු සංශෝධන මේ වන විටත් සිදු කර ඇති බව නිරීක්ෂණය වේ.

03	ලංසු ලේඛනයන්ට සංශෝධනයක් සිදු කිරීමේදී අදාළ තහවුරු කිරීම් සහ බැඳීම් වලට අගතියක් නොවන පරිදි එවැනි සංශෝධනයන්ගේ නීත්‍යානුකූලභාවය තහවුරු කර ගැනීමෙන් පසුව එවැනි සංශෝධනයන් සිදු කල යුතු අතර, එම සංශෝධනයට ගැලපෙන පරිදි ලංසු ලේඛනයෙහි අනෙකුත් වගන්ති හා ගිවිසුම් සංශෝධනය කිරීමට වග බලා ගත යුතුය. ලංසු ලේඛනයන්ට ලංසු කැඳවීමෙන් පසු ප්‍රබල සංශෝධනයක් කිරීමෙන් හැකි සෑම විටම වැලකී සිටිය යුතුය. ලංසු ලේඛනයන්ට පසුව කරන සංශෝධනයන්හිදී එම සංශෝධනයන්ට අනුගත වීම සඳහා සියළුම ලංසුකරුවන්ට සාධාරණ කාලයක් ලබා දීමට ක්‍රියාකල යුතුය	මේ පිළිබඳව අවධානය යොමුකර ඇති අතර ඒ අනුව සියළුම ලංසුකරුවන්ට සාධාරණ කාලයක් ලබා දීමට හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි **5.3.15** හි විධිවිධාන අනුව ප්‍රසම්පාදන වලදී එකී සංශෝධනයන් සිදු කිරීමෙන් වැලකීමට හැකි සෑම විටකම කටයුතු කරන අතර ලංසු ලේඛනයන්ට එවන් සංශෝධනයන් සිදු කරන අවස්ථාවන්හිදී එම සංශෝධනයන්ට අනුගත වීම සඳහා සියලු සැපයුම්කරුවන්ට සාධාරණ කාලයක් ලබා දීමට කටයුතු කරනු ඇත.	සංශෝධනයන්ට අනුගත වීම සඳහා සියළුම ලංසුකරුවන්ට සාධාරණ කාලයක් ලබා දීම සම්බන්ධයෙන් විදුලිබල හා බලශක්ති අමාත්‍යාවරයා අවධානය යොමු කර ඇති බව ප්‍රකාශ කර ඇති බව නිරීක්ෂණය වේ.
04	ගල් අඟුරු ප්‍රසම්පාදනයේදී මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව සකස් කල යුතු ප්‍රසම්පාදන සැලැස්ම පරිපූර්ණ ලෙස විධිමත්ව සකස් කර අනුමත කර එයට අනුගත කල යුතු වීම සහ කාලීනව ගල් අඟුරු සැපයීම තහවුරු වන පරිදි මූල්‍ය සම්පාදනයන් පිළිබඳව පූර්ව එකඟතාවයක් ලබා ගැනීමේ හැකියාව පිළිබඳව අවධානය යොමු කල යුතුය.	ගල් අඟුරු සැපයීමේදී මූල්‍ය සම්පාදනය පිළිබඳව පැහැදිලිව එකඟතාවන්ට පැමිණේ. නමුත් මෙම විමසුමට අදාළ කාලය තුළ කෝවිඩ් **19** වසංගත තත්වය සහ රටේ පැවති අයහපත් මූල්‍ය තත්වය හා ලංකා විදුලිබල මණ්ඩලයේ අයක්‍රම මඟින් ලබාගත් ආදායම ප්‍රමාණවත් නොවීම මත ප්‍රමාණවත් රුපියල් හා විදේශ විනිමය ද්‍රවශීලතා හේතූන් මත ඊට පෙර වාරයේ දී මෙන් මුදල් තත්වය සම්බන්ධ පූර්ව එකඟතාවයක් ඇති කර ගැනීම අපහසු විය. මෙම තත්වය විශේෂයෙන්ම ලංකාවේ පැවති අයහපත් ද්‍රවශීලතාවය සහ රටේ පැවති විදේශ විනිමය හිඟතාවය විශාල වශයෙන් බලපෑ අතර එය පාලනය කර ගත නොහැකි සාධකයකි. එහෙත් මේ වනවිට රටේ මූල්‍ය තත්වය යහපත් වෙමින් ඇති බැවින් හා අයක්‍රම මත ආදායම් රැස් කිරීම වාර්තා වී ඇති බැවින් ඉදිරි ටෙන්ඩර් වලදී කාලීනව ගල් අඟුරු සැපයීම තහවුරු වන පරිදි මූල්‍ය සම්පාදනයන් පිළිබඳව පූර්ව එකඟතාවයක් ලබා ගැනීමේ හැකියාව පිළිබඳව වැඩි අවධානය යොමුකර ඇත.	කොවිඩ් **19** වසංගතය සහ එවකට රටේ පැවති අයහපත් මූල්‍ය තත්වය හේතුවෙන් ප්‍රසම්පාදන සැලැස්මට අනුකූලව කටයුතු කිරීමට ඒ/ස ලංකා කෝල්(පුදු) සමාගමට නොහැකි වී ඇති බව විදුලිබල හා බලශක්ති අමාත්‍යාවරයා විසින් දක්වා ඇත. කෙසේ වුවත් විදුලිබල හා බලශක්ති අමාත්‍යාවරයා විසින් ගල් අඟුරු ප්‍රසම්පාදනය පිළිබඳ උපදෙස් සහ සමීප අධීක්ෂණයට ලක් කිරීමත් සිදු කල යුතු බව නිරීක්ෂණය කරමි.
05	එසේ සැපයුම්කරුවකුට වැඩි සංඛ්‍යාවකගේ එකතුවකින් ප්‍රසම්පාදන සඳහා කටයුතු කරන්නේ නම් හා දැනට ලියාපදිංචි සැපයුම්කරුවන්ටද ප්‍රසම්පාදනයට සහභාගි වීමට අවස්ථාව ලබා දෙමින් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට අනුමැතිය ලබා දී තිබුණි. විවෘත ජාත්‍යන්තර ටෙන්ඩර් ක්‍රියාවලියක් ආරම්භ කිරීමේදී ගල් අඟුරු සමාගම විසින් දැනට සැපයුම්කරුවකු	මෙම කරුණට අදාළ ලංසු ලියැවිල්ලේ පැවති එම කොටස සඳහා අවශ්‍ය නීතිමය උපදෙස් ලබා ගැනීමෙන් පසු සංශෝධනය කර ඇති අතර පසුව කැඳවන ලද ලංසු සඳහා එම සංශෝධන සහිත ලංසු ලියවිල්ල සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ නිෂ්කාශනය ද ලබාගෙන ඇත. ඉදිරි ටෙන්ඩර් වලදී නීතිපති දෙපාර්තමේන්තුවේ නිෂ්කාශන ලබා	විදුලිබල හා බලශක්ති අමාත්‍යාවරයා විසින් ඒ/ස ලංකා කෝල්(පුදු) සමාගම වෙත අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බව නිරීක්ෂණය වේ.

	ලියාපදිංචි කිරීමේදී මූල්‍ය හා තාක්ෂණික ශක්‍යතාවය ඇගයීමට ලක් කරනු ලබන අවම මූලික සුදුසුකම් ලංසු ලේඛනවල ලංසුකරුවන් ඇගයීමේ නිර්ණායක ලෙස ඇතුළත් කල යුතු බව නිර්දේශ කෙරේ.	ගැනීමෙන් පසුව පමණක් ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ.	
06	ගල් අඟුරු ප්‍රසම්පාදනයට අදාළ සංයුක්ත දර්ශක තීරණය කිරීමේදී උපරිම ආර්ථික වාසියක් රජයට ලබා ගත හැකි පරිදි එම දර්ශක සකස් කිරීමට යොදා ගන්නා කලාපීය දර්ශක පිළිබඳව කාලීනව නැවත සලකා බැලීමට කටයුතු කල යුතුය.	මේ පිළිබඳව අවධානය යොමුකර කටයුතු කරන ලෙස අදාල අංශ වෙත දැනුම්දී ඇත. තවද අවිනිශ්චිත තාවයකදී රටට වඩාත් හිතකර දර්ශක භාවිතා කිරීම පිළිබඳ ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව වෙතින් ද මේ පිළිබඳ තවදුරටත් නිරීක්ෂණ ලබාගැනීමට ගල්අඟුරු සමාගම කටයුතු කර ඇත. තවද කොළඹ විශ්ව විද්‍යාලයෙන් ද මේ පිළිබඳ නිරීක්ෂණ ඉල්ලා ඇති අතර සියලු කලාපීය දර්ශකයන් පිළිබඳව කාලීනව නැවත සලකා බැලීමක් කරමින් වඩාත් වාසිදායක දර්ශක මත ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර ඇත.	විදුලිබල හා බලශක්ති අමාත්‍යාවරයා විසින් සී/ස ලංකා කෝල්(පුද්) සමාගම වෙත අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බව නිරීක්ෂණය වේ.
07	**2022** සැප්තැම්බර් **22** දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙහි විවෘත ජාත්‍යන්තර ටෙන්ඩර් ක්‍රියාවලිය අනුගමනය කරමින් හා දැනට ලියාපදිංචි සැපයුම්කරුවන්ටද ප්‍රසම්පාදනයට සහභාගි වීමට අවස්ථාව ලබා දෙමින් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට අනුමැතිය ලබාදී තිබුණි. විවෘත ජාත්‍යන්තර ටෙන්ඩර් ක්‍රියාවලියක් ආරම්භ කිරීමේදී ගල් අඟුරු සමාගම විසින් දැනට සැපයුම්කරුවකු ලියාපදිංචි කිරීමේදී මූල්‍ය හා තාක්ෂණික ශක්‍යතාවය ඇගයීමකට ලක් කරනු ලබන අවම මූලික සුදුසුකම ලංසු ලේඛනවල ලංසුකරුවන් ඇගයීමේ නිර්ණායක ලෙස ඇතුළත් කල යුතු බව නිර්දේශ කෙරේ.	මේ සම්බන්ධව අවධානය යොමු කිරීමෙන් අනතුරුව විවෘත ජාත්‍යන්තර ටෙන්ඩර් ක්‍රියාවලියක් ආරම්භ කිරීමේදී ගල් අඟුරු සමාගම විසින් දැනට සැපයුම්කරුවකු ලියාපදිංචි කිරීමේදී මූල්‍ය හා තාක්ෂණික ශක්‍යතාවය ඇගයීමට ලක් කරනු ලබන අවම මූලික සුදුසුකම් ලංසු ලේඛනවල ලංසුකරුවන් ඇගයීමේ නිර්ණායක ලෙස ඇතුළත් කර ඇත. ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු ලබාගැනීමේදී මෙම තත්වය බලපෑමක් සිදු නොවේ. මේ වන විටත් විවෘත ලංසු කැඳවීමේදී සුදුසුකම් ලැබීමේ නිර්ණායක ලෙස **(Eligibility criteria)** ලෙස වගන්ති **2.8** ලෙස විවෘත ජාත්‍යන්තර ලංසු කැඳවීමේ ලේඛනයට ඇතුලත් කර ඇත.	විදුලිබල හා බලශක්ති අමාත්‍යාවරයා විසින් සී/ස ලංකා කෝල්(පුද්) සමාගම වෙත අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බව නිරීක්ෂණය වේ.
08	මෙම ප්‍රසම්පාදනයට අදාළව වඩාත් ප්‍රශස්ත අනුමැතීන් ලබා දිය හැකි වන පරිදි අවශ්‍ය අධ්‍යයනයන් කිරීමට සහ තොරතුරු ලබා ගැනීමට ප්‍රමාණවත් කාලයක් අමාත්‍ය මණ්ඩලය වෙත ලැබෙන ලෙස නිවැරදි තොරතුරු අප්‍රමාදව ඉදිරිපත් කිරීමට අදාළ නිළධාරීන්ට නියම කිරීම.	ඉදිරි ප්‍රසම්පාදනයන් හිදී ඒ අනුව කටයුතු කිරීමට කටයුතු කරමින් පවතී.	සී/ස ලංකා කෝල්(පුද්) සමාගම වෙනුවෙන් විදුලිබල හා බලශක්ති අමාත්‍යාවරයා විසින් අවශ්‍ය පියවර ගෙන ඇති බව නිරීක්ෂණය වේ.